# ඓතිහාසික පරමාකන්ද රජ මහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

එච්.ඩී.ඩී. සේනාරත්න[1]

ඓතිහාසික පරමාකන්ද රජ මහා විහාරය පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරමාකන්ද ග්‍රාමයට අයත් පැරණි විහාරස්ථානයකි. මෙම විහාරයේ ඉතිහාසය සලකා බැලීමේ දී අනුරාධපුර යුගයේ ඇරඹෙන මෙම පැරණි ලෙන් විහාරය අනුරාධපුර යුගයෙන් පසු විවිධ ආක්‍රමණ, වසංගත ආදී විවිධ හේතු මත මෙහි දියුණුව අඩපණ වූ අතර යළි ප්‍රකෘතිමත් වන්නේ මහනුවර යුගයේදීය. ඒ අනුව දැනට හමුව ඇති පුරාවිද්‍යාත්මක නටබුන් අතර ප්‍රධාන ලෙන් විහාර සංකීර්ණය, ශිලා ලිපි, දාගැබ්, රහත්ගල මුදුන් පිළිමගෙය, සිරිපා සලකුණ, ශිලාමය බුදු පිළිම ද්විත්වය, පුරාණ දැව කොටස්, ගල් කණු සහ ගල් පාදම වැනි මානවකෘති පෙන්වා දිය හැකි වේ. විහාරයේ සෙල්ලිපි අටක් පවතින බැවින් ඒවා අනුරාධපුර යුගයට අයත් වන බව පිළිගැනෙන අතර මහනුවර යුගයට අයත් යැයි සැලකෙන ප්‍රධාන ලෙන් විහාර සංකීර්ණයේ සිතුවම් කරඇති රහත්ගල මුදුන් පිළිමගෙයි සිතුවම් හා ප්‍රතිමා අන්තවාදී පිරිසක් විනාශ කර දමා ඇති නිසා අවශ්‍ය තොරතුරු ලබාගත නොහැකි වී තිබේ. මෙම විහාරය මහාවංසයේත්, පරමාකන්ද හා තෝනිගල සෙල්ලිපිවලත් සඳහන් වන්නේ අච්චගිරික පබ්බත යන නාමයෙනි. එකල සොළී පාලනයෙන් රජරට නිදහස් කරගැනීම සඳහා වළගම්බා රජු සේනා සංවිධානය කළ අවසාන යුධ මධ්‍යස්ථානය ලෙස මෙම ස්ථානය භාවිත කළ බව පිළිගැනෙන බැවින් පරමාකන්ද රජ මහා විහාරයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම කුමක් ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වේ. මෙම විහාරය සම්බන්ධයෙන් විධිමත් ගවේෂණයක් හෝ කැනීමක් මෙතෙක් සිදු වී නොමැති නිසා විධිමත් පර්යේෂණයක් සිදුකිරීමටත් එහි වැදගත්කම සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් ආරක්ෂා කරගැනීම සඳහා විවිධ අන්තවාදීන්ගෙන් හා නිධන් සොරුන්ගෙන් ආරක්ෂා කරගැනීමටත් යෝජනා ඉදිරිපත් කිරීමට හා සංචාරක ස්ථානයක් ලෙස දියුණු කිරීමේ වැදගත්කම පෙන්වාදීම් යන කාරණා ඉස්මතු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අරමුණ සාධනය සඳහා අධ්‍යයන ක්‍රමවේදය ලෙස මූලාශ්‍ර පරිශීලනය හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදුකරන පදි.

ප්‍රමුඛ පද : පරමාකන්ද විහාරය, පුරාවිද්‍යාත්මක නටබුන්, ශිලා ලිපි, සිතුවම් සහ ප්‍රතිමා

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.hdds1029@gmail.com